
# සමනලයාගේ උපත



නෙතුලි දහම්සා රණසිංහ

# සමනලයාගේ උපත


## නෙතුලි දහම්සා රණසිංහ

**කතෘ**


## කතෘගේ වෙනත් කෘති

**වලස් පැංචාගේ නුවණ**


මහ/මහාමායා බාලිකා විදුහල, මහනුවර
3 ශ්‍රේණිය

2026.05.10


**ISBN 978-624-211-061-5**

# පිදුම

පුරා තෙවසරක කාලයක් මාගේ නැණස විවර
කරන්නට උර දුන් මා සදාදරණීය මහාමායා
මෑණියනි, මාගේ ලේඛන දිවියේ දෙවන
එළිදැක්වීම වන මෙම පර්යේෂණාත්මක කෘතිය
මෙලෙස ඔබට බැතියෙන් පුදනෙමි..............

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාතකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.


2026-05-10

## සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10



යාළුවනේ, අපි බලමු කොහොමද සමනලයෙක් හැදෙන්නේ කියලා...



මුලින්ම අපි සමනල බිත්තර ටිකක් හරි දළඹුවෙක් හරි හොයා ගනිමු.

මේ බලන්න... මම මේ දළඹු පුංචාව හොයා ගත්තේ අපේ අත්තම්මලාගේ වත්තෙන්.

ඔන්න මම විනිවිද පෙනෙන බෝතලයක් අරගෙන දළඹු පුංචා හිටිය කොළය එක්කම කඩලා බෝතලය ඇතුළට දැම්මා.

දළඹු පුංචා ආහාර විදියට ගන්නේ එයා හිටිය ශාක වර්ගයේ ම කොළ නිසා මම තවත් ඒ වර්ගයේ ම කොළ ටිකක් කඩලා බෝතලය ඇතුළට දැම්මා.



දළඹු පුංචාට හුස්ම ගන්න පුලුවන් වෙන්න බෝතලේ මූඩියේ සිදුරු කිහිපයක් විදලා මූඩිය වහලා තිබ්බා.





දෙවෙනි දවසෙ උදෙන්ම මම බෝතලය හොඳින් නිරීක්ෂණය කළා. බෝතලය ටිකක් අපවිත්‍ර වී තිබුණා. ඉතින් මම දළඹු පුංචාව එළියට අරන් බෝතලය හොඳින් පිරිසිදු කරලා අලුතින් කොළ දැම්මා.

ඊට පස්සේ දවසින් දවස දළඹුවාගේ සිදුවන වෙනස්කම් දිහා හොඳින් බැලුවා. හැමදාම බෝතලය පිරිසිදු කළා. දළඹු පුංචාට කන්න කොළත් දැම්මා.

පස් වෙනි දවස වෙනකොට මකුළු දැලක් වගේ බැඳලා කෝෂය හදන්න පටන්ගෙන තිබුණා.



දැන් දළඹු පුංචා පිළා කෝෂයක් හදලා පිළවෙක් බවට පත් වෙලා. දැන් අලුතින් කොළ දාන්නේ නැහැ.



බෝතලය පිරිසිදු කරන්නෙත් නැහැ. මොකද දැන් කෝෂය ආරක්ෂා කරන්න ඕනෑ.

පිළවා හැදුණ දවසේ ඉඳන් මම ආයෙත් කලින් වගේම දවසින් දවස බෝතලය හොඳින් නිරීක්ෂණය කළා.

පිළවා හැදුණ දවසේ ඉඳන් දවස් නවයක් යනකොට පිළා කෝෂය හොඳින් වර්ධනය වෙලා.



දවස් දාහතරක් යනකොට සමනලයා එළියට එන්න සූදානම්.

ඉතින් ලස්සන සමනලයෙක් පිළා කෝෂය සිදුරු කරගෙන එළියට එයි කියලා මම බලාගෙන හිටියත් ආවෙ වෙනත් යාළුවෙක්. එයත් සමනලයා වගේම තමයි.





ඒත් පොඩි වෙනසක් තියෙනවා. එයාගේ පියාපත් පිහිටලා තියෙන්නේ පොළොවට සමාන්තරව.

සමනලයාගේ පියාපත් පිහිටන්නේ පොළොවට ලම්භකව.

ඉතින් එහෙම හැඳුණ අලුත් යාළුවාගේ නම තමයි **සලබයා**. එයත් හරිම ලස්සනයි.





ඉතින් යාළුවනේ, පුංචි ඔයාලත් මේ වගේ ලස්සන සලබයෙක් හරි සමනලයෙක් හරි හදන්න උත්සාහ කරලා බලන්න. ඒක හරිම විනෝදජනක පර්යේෂණයක්.



-නිමි-

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර**" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගා වේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)